## ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

# රැකියා අවස්ථා

ISO 9001:2015 ජාත්‍යන්තර තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ප්‍රධාන පෙළේ රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. යන්ත්‍රාගාර ක්‍රියාකරවීමේ කාර්මික - 111 ශ්‍රේණිය - තනතුරු 07

**බාහිර / අභ්‍යන්තර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු කිරීමේ ආයතනයක් විසින් පවත්වනු ලබන විදුලි කාර්මික ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම (04 වන මට්ටමට (NVQ Level 04) නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතික පත්‍රයක් ලබා තිබිය යුතුය.

**වැටුප් පරිමාණය** : PL 03 - රු. 43,280 - 10X490 - 10X540-10X590 - 12X630 - 67,040/=

**වයස් සීමාව** : අවුරුදු 18 ත් - 45 ත් අතර විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව ඉහත වැටුප් පරිමාණය 2027.01.01 දින සිට පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනු ඇත.

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර, තනතුරේ රාජකාරී මනාව ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.

සියලුම අයදුම්කරුවන් තම ජීව දත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපන, වෘත්තීය සහ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ පහත සඳහන් ලිපිනයට 2026.08.19 හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ඉල්ලුම් කරන තනතුරේ නම අදාළ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම් කරන තනතුරට අදාළ සුදුසුකම්වල සහතික පිටපත් ඉදිරිපත් කර නොමැති සහ නිසිපරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ අයදුම්පත්‍රය www.landdevelopment.lk වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන),**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.**

රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක දැනටමත් සේවයේ නියුතු අය තමන්ගේ ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර, අයදුම්කරු අදාළ තනතුරට තෝරා ගතහොත් එම තනතුරෙහි වැඩ භාර ගැනීම සඳහා අදාළ ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**සභාපති**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.**
**වෙබ් අඩවිය : www.landdevelopment.lk**